සාරාංශය

සමාජ දියුණුවත් සමඟ සංකීර්ණ වූ මිනිස් අවශ්‍යතා වලට ගැලපෙන ලෙස වෙනස් වීම් වලට භාජනය වූ නූතන අධ්‍යාපන ක්‍රමය තුළ රටට අවශ්‍ය ශ්‍රමිකයින් ප්‍රහුණු කිරීමේ වගකීම් පාසල වෙත පැවරිණි. නිදහසට පෙර කන්නන්ගර යුගයේ සිටම ලංකාවේ අධ්‍යාපනය හා ආර්ථිකය අතර ගැලපීමක් ඇති කිරීමට උත්සාහ කළද තවමත් එය නිසි ඵල දරා නොමැති බව පෙනේ. මෙම තත්ත්වය තුළ ලංකාවේ අධ්‍යාපනය තුළින් බිහිවන උගතුන්ට රැකියා සැපයීමට අපොහොසත්ව ඇත.

ලංකාවේ සමාජ ක්‍රමය තුළ තවමත් වැඩි ඉල්ලුමක් සහ පිළිගැනීමක් පවතින්නේ ඉහළ ශාස්ත්‍රීය අධ්‍යාපනයක් අවශ්‍ය වෘත්තීන් සඳහාය. මෙම තත්ත්වය නිසා ශ්‍රමිකමාන රැකියා කෙරෙ යොමු වීමට වැඩි දෙනෙකු අකමැත්තක් දක්වති. එමෙන්ම ලංකාවේ පාසල් තුළින් ලබන අධ්‍යාපනය ශ්‍රමිකමාන රැකියා කෙරෙ යොමු වීමට හෝ රට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීමට සමත් නොවේ. එසේ වුවද මෙරට ආර්ථිකය තුළ වැඩි සැපයුමක් ශ්‍රමිකමාන රැකියාවලට ඇත. මෙවැනි පසුබිමක් තුළ පාසල් සිසුන්ගේ වෘත්තීය අපේක්ෂා කෙබඳුද යන්න ගවේෂනය කිරීමත් රට බලපාන හේතු කාරක මොනවාද යන්න විමසා බැලීමත් වැදගත් වේ.